සන්නස
SANNASA

# මාර්ග ඵල ලාභියා

විශ්‍රාමික ලේඛකාධිකාරී
**ජිනදාස එම් ගමගේ**



හරි කෙළින් අඩි තුනක් උඩ ගිය යම රජු අඩි පහක් පිටුපසට විසි වී ගොස් බිම ඇද වැටිණි. තව අඩි දෙකක් එහා මෙහා වී නම් පැහී ගොජදාන ලෝ දිය කටාරමෙන්. ජබොග්. ශබ්දය මතුවීමට ඉඩ තිබිණි. අනූනවයයි තුන්කාලෙන් බේරුණ යම රජුගේ තට්ටම බිම වැටී විසිරී තිබුණ කටු ඉඹුලකටු කිහිපයක් ඇනී තුවාල විය. දැඩි වේදනාවට පත් ඔහු පිටුපස අත ගාමින් නැගී සිටියේය. මේ මොහොතේ ඔහුගේ සියොළඟම වෙව්ලා යන හැටි යමකු දුටුවේ නම්, අනේ මේ යම රජුම දැයි, සැකයෙන් බලනු ඒකාන්තය. ඔහුගේ හැම මයිලක් මයිලක් ගානේම ඩහදිය බිඳු නොව ඩහදිය ගංගාවන් ගලා බස්නට වන්නේය. ගොබළු ගෙඩි දෙකක් වන්ව ඉදිරියට නෙරා තිබුණ රතු පාට දෙනෙත තව තවත් ඉදිරියට නෙරා එන්නට පටන් ගත්තේය. මුඛයේ දෙපැත්තෙන් මතු වී කම්මුල් දෙසට හැරී නැමී ගිය ලොකු උල් දත් දෙකෙන් මතු වූ කිටි කිටි ශබ්දය යම ලොව පුරාම දෝංකාරය දෙන්නට විය. දෑත් එක්කර නමස්කාරය කරමින්ද, වෙව්ලන දෙපයින්ද, මඳක් ඉදිරියට පැමිණි යමරජු, ඔබතුමා මීට මොහොතකට පෙර ප්‍රකාශ කර සිටි ප්‍රකාශය නැවත වරක් ප්‍රකාශ කර සිටිත්වා, යි පිංපාට පෙනුමින් පරිපූර්ණව අභිමානවත් ලෙස ඔහු ඉදිරියේ සිටින, මීට මොහොතකට පෙර යම ලොවට සපැමිණි අමුත්තාගෙන් ආයාචනාත්මකව ඉල්ලා සිටියේය.

කෙනකු දවා පුළුස්සා හළුකර දැමිය හැකි බැල්මක් යම රජු දෙසට යොමු කළ අමුත්තා ,මොකාද මම මෙතෙනට එව්වේ. මම මාර්ගඵලලාභියෙක්. මාර්ගඵල ලාභීන්ට නියමිත දෙව්ලොව මිස යම ලොව නොවෙයි. වැඩ වරද්දා ගන්නේ නැතිව වහාම වරද නිවැරදි කරනු. මට නියමිත තැන වහාම ලබා දෙනු, යි ගුගුළේය. ඒ හඬ යම ලොව පුරාම තැන තැන තිබුණ ලෝදිය ගුදම්වල ගොජ ගොජ ශබ්දය ද යටපත් කළේය.

'උතුමාණනි' මට සමාවන සේක්වා. මේක මගෙන් සිදුවුණු වරදක් නොවෙයි. නිහෙක් මැරුණට පස්සෙ ඒ මිනිය අයිති යම ලොවටද, දෙව් ලොවටද යන්න තීරණය කරන්නෙ මම නොවෙයි. මට පැවරිලා තියෙන එකම රාජකාරිය යම ලොවට යම් කෙනෙක් ආවොත් ඔහු කරලා තියන පාපී ක්‍රියාවල ස්වභාවය අනුව ඔහුට දඬුවම් කරන එකයි. ඇත්ත වශයෙන්ම ඔබතුමා මාර්ගඵල ලාභියෙක් නම් මෙතෙන්ට එන්න කිසිම හේතුවක් නැහැ. කොතනක හරි ලොකු වරදක් වෙලා තියෙන හැඩයි. උපන් ජීවිතේට මේ වගේ අකරතැබ්බයකට නම් මම මූණදීල නැහැ., යම රජු තම දකුණු අතේ පිටි අල්ල උඩ නිකට තබා ගත්තේය. යම රජු දෙනෙත් කරකවා වටපිට බැලුවේය. ඔහු වටා සිටි යමපල්ලෝ තුෂ්නිම්භූතව සිටියහ. තම මහරජතුමාගේ කවදාවත් නැති බියගුලු ස්වභාවය ඔවුන්ගේ කොඳු නාරටි නවා දමා තිබිණි.

(මා මෙතැන් සිට පෙර කී අමුත්තා හඳුන්වනු ලබන්නේ මාර්ගඵලලාභියා කියාය. ඔහුගේ අතීත කතාවේ වංහුං වලින් බිඳක් පහත පරිදි වේ.)

මාර්ගඵලලාභියා උපත ලබා ජීවත් වූයේ වනාතමුල්ලේ පිහිටි මුඩුක්කු නිවාසයකය. සමහර පොත්පත්වල දැක්වෙන ආකාරයට බොහෝ ආශ්චර්යවත් උදවිය උපදින විට සිදුවන්නා සේ මොහු උපදින විට මුළු රටේ තබා වනාතමුල්ලේවත් පිරී ඉතිරී තිබුණ කිසිම ආයුධයක් දිළිසුණේ නැත. මහ පොළොව කම්පා වීමෙන් හෝ සංතෘප්තියට පත් වීමෙන් හෝ සෙලවී ගියේ නැත. එහෙත් ඔහු උපන්නේය. සිදුවූ එකක් නම් නොකියා බැරිය. හැම දරුවකුම මෙලොවට බිහිවන්නේ සිහින් හැඬුමක් සමඟය. එහෙත් මොහු උපදින විට එය මර ලතෝනියක් විය. ඒ හඬ සූතිකාගාරයේ දොර ජනෙල් බිත්ති ද කඩා ගෙන එළියට පැන මුළු රෝහල් සංකීර්ණයම අන්ද මන්ද කළේය. ඒ මොහොතේ අනාගතය දකින වක්තෘවරයකු සිටියා නම් මොහු අනාගතයේ කිනම් ආකාරයේ පුද්ගලයකු වනවා දැයි එක ඇඟිල්ලක් පමණක් උස්සා අනාගත වාක්‍යයක් දෙසාබානු ඒකාන්තය. මාර්ගඵල ලාභියාගේ මව පංචකල්‍යාණයෙන් ම පරිපූර්ණ වූ ලලිතා නම් ගණිකාවය.

මේ ඇයගේ කුළුඳුල් දරුවාය. එහෙත් වැඩ සිද්ධ වුණු ආකාරයට වැදුවා නම් ඇය මෙලහකට දරුවන් සිය ගණනක් වදා අවසානය. දරුවන්ට වඩා අඟපසඟ ක්‍රමානුකූලව තබා ගැනීම වෘත්තීය සුදුසුකමේ පළවන අංකය බව ලලිතා තරම් දන්නා කෙනෙක් මුළු වනාතමුල්ලේම සිටියේ නැත. මාර්ගඵල ලාභියාගේ කර්මඵල ශක්තිය, කෙසේ හෝ ඔහු මේ ලෝකයට ගෙන ආවේ පරෝපකාරය සඳහාම විය හැක.

මාර්ගඵලලාභියාගේ පියා කවරෙක්දැයි ලලිතා ස්ථිර වශයෙන් ම නොදැන සිටියාය. එහෙත් දෙදෙනකු ගැන ඇය අනුමාන කළා ය. එක් අයකු බොහෝ දෙනාගේ වන්දනාමානවලට හා ගෞරවාදරයට පාත්‍ර වූ කෙනකු වන අතර අනෙක් තැනැත්තා සමානාත්මතාව මූලික සිද්ධාන්තය කොට ගෙන වඩා යහපත් ලෝකයක් නිර්මාණය කිරීම සඳහා පැය විසිහතර පුරාම වෙහෙස මහන්සිය නොබලා වැඩ කරන අයෙකි. මොවුන්ගේ නම් ගම් හෙළි කර පිටකොන්ද බිඳ දමන්නේ කුමකට ද? එවිට සමාජයට සිදුවන්නේ දැරිය නොහැකි පාඩුවකැයි සිතූ ලලිතා මුනිවත රැක්කාය. කෙසේ වෙතත් ළමයා උස් මහත් වන විට ළමයාගේ හැඩහුරුකම කිරා මැන බලා මේ දෙදෙනාගෙන් සැබෑ වශයෙන් ම ළමයාගේ පියා කවරෙක් දැයි සක්සුදක් සේ දැන ගැනීමට හැකිවනු ඇතැයි ලලිතා සිතා ගත්තාය.

අනෙක් මුඩුක්කු දරුවන්ට වඩා කැපී පෙනෙන අයුරින් මාර්ගඵල ලාභියා වැඩුණේය. පාසල් ගමන වසර පහකට පමණක් සීමා කළ ඔහු වයස දහඅට වන විට වනාතමුල්ලේ සිටි චන්ඩීන්ගෙන් එක් අයකු බවට පත්වූයේ නාට්ටාම් කෙනෙකුගේ දණහිස් දෙකම එකම පහරකින් කඩා දැමීමෙනි. එතැන් සිට ඔහු ඔහුට උරුම හා නියමිත ගමන කුමක් දැයි තෝරාගෙන විජයග්‍රාහී ලෙස ඉදිරියට ගියේය. මැතිවරණයකදී ඔහුගෙන් උදව් ලබාගත් නාගරික මන්ත්‍රීවරයකු ටෙන්ඩර් මගඩියක් කර මස්කඩ හතරක ටෙන්ඩර මාර්ගඵලලාභියාට ලබා දුන්නේය. ඔහුගේ අසමසම ගමන ඇරඹුනේ මෙතැන් සිටය. ඔහු වටා සහපිරිවර එකතු වන්නට පටන් ගත්තේ නිල මැස්සන් පරිද්දෙනි.

'පළමුව වනාතමුල්ලේ රජා විය යුතුය.' ඔහු සිතුවේය. ගිනි මද්දහනේ දෙනෝදහසක් ඉදිරිපිටදී වනාතමුල්ල යටත් කර ගෙන සිටි කෙළිකාරයා මරා දැමූ මාර්ගඵලලාභියා ඉන් නොනැවතී මාස කිහිපයක් ඇතුළතම මුළු කොලොම්තොටම සිය අණසකට ගත්තේය. දේශපාලනඥයෝ කිහිපදෙනකුගේම අවධානය මාර්ගඵලලාභියා වෙතට යොමු වන්නට පටන් ගත්තේ මෙතැන් සිටය. ඉතා හොඳින් සිතා බැලූ මාර්ගඵලලාභියා ප්‍රබල ඇමැතිවරයකුට එකතු විය. ඇමැතිවරයා ඔහුට මල් මාලා නොදැම්මා පමණි. තමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඇප කැප වී වැඩ කළ හැම දෙනකුටම වඩා ඇමැතිවරයාට මාර්ගඵලලාභියා උතුම් කෙනකු බවට පත්විය. ,මේ වගේ මිනිහෙක් ඉන්නව නම් මැතිවරණ වලින් දිනන එක මොන කජ්ජක් ද? ඇමැතිවරයාට එසේ සිතෙන්නට ඇත. අලුත් ඇසුර මාර්ගඵලලාභියා උඩු යටිකුරු කර දැම්මේ ය. ඒ රාජ්‍යබලයෙන් බිඳක් ද ඔහු ළඟ හොල්මන් කිරීමට පටන් ගත් බැවිනි. මොහුගේ ආදායම් මාර්ග සීග්‍රයෙන් වැඩි වන්නට පටන් ගත්තේය. ගෝල බාලයෝ ඔහුගේ නියෝග දේවකාරියක් ලෙස සලකා නිමේෂයකින් ඉටු කළහ.

කොන්ත්‍රාත් පදනම මත මිනීමරුම්, පැහැරගෙන යැම් ආදී වශයෙන් වූ අනේකවිධ අපරාධවලින් නොනැවතුන මොහු මවගේ අනුදැනුමෙන් හා පළපුරුද්දෙන් ද ප්‍රයෝජන ගැනීමට සිතා සුපිරි පන්නයේ ගණිකා නිවාස රාශියක් ද ආරම්භ කළේය. ඒවායේ සම්පූර්ණ පාලනය මෑණියන්ට පවරන ලදී.

ඇමැතිවරයාගේ දැඩි බලකිරීම මත මාර්ග කොන්ත්‍රාත් වැඩට මර්ගඵලලාභියාට අත ගැසීමට සිදු වූයේ මේ අතර වාරයේය. ඔහු

42 වන පිටට